*සැ. යු.*- 2013.07.12 දින පළ වූ අංක 1819 දරන *ගැසට් පත්‍රයේ* I: III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,820 - 2013 ජූලි මස 19 වැනි සිකුරාදා - 2013.07.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1674 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1679 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1680 |


*සැ. යු.*- (i) පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත, 2013 මැයි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී ;

(ii) කුල්ලියතුල් ඉමාම් ෂාෆිර් අරාබි විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 ජුනි මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී ;

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 අගෝස්තු මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජූලි මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

### සීතාවකපුර නගර සභාව - අවිස්සාවේල්ල

බස්නාහිර පළාතේ, පළාත් රාජ්‍ය සේවයේ සීතාවකපුර නගර සභාවේ පුරප්පාඩු ඇති පහත සඳහන් තනතුරුවලට අදාළ අවම සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රය ප්‍රකාර සකස් කරගත් ඉල්ලුම්පත්‍ර (12" x 8" ප්‍රමාණයේ) "ලේකම්, සීතාවකපුර නගර සභාව, අවිස්සාවේල්ල" යන ලිපිනයට 2013.08.02 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර එවිය යුතුය. අසම්පූර්ණ ඉල්ලුම්පත් මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.

| *අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | පෙදරේරු (ශිල්පීය III ශ්‍රේණිය) | 01 | රු. 12,210-10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 (PL-2(2006A) | I. ජාතික පොදු සහතික පත්‍ර (සා.පෙ.) හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී කුමන හෝ විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්වී තිබීම. මින් විෂයයන් 05ක් එකවර සමත්වී තිබිය යුතුය.<br>II. තනතුරට අදාළ වසර දෙකක පළපුරුද්දක් අවම වශයෙන් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.)<br>III. වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමේ සහතිකය ලබා තිබීම;<br>හෝ<br>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම;<br>හෝ<br>ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබ ා තිබීම;<br>හෝ<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA)වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨාමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨාමාලවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>හෝ<br>තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨාමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම. |

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|
| 02. පැස්සුම්කරු (ශිල්පීය III ශ්‍රේණිය) | 01 | රු. 12,210-10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 (PL-2(2006A) | I. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී කුමණ හෝ විෂයයන් 06ක් සමත්වී තිබීම. මින් විෂයයන් 05ක් එකවර සමත්වී තිබිය යුතු ය.<br>II. තනතුරට අදාළ වසර දෙකක පළපුරුද්දක් අවම වශයෙන් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.)<br>III. වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමේ සහතිකය ලබා තිබීම,<br>හෝ<br>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET)වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම,<br>හෝ<br>ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA)වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම,<br>හෝ<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA)වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලවක් හදාරා සහතිකය ලබා තිබීම,<br>හෝ<br>තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම, |
| 03. රියදුරු (II ආ පන්තිය) | 06 | රු. 12,470-10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 (PL-3(2006A) | I. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 වසර සමත්වී තිබීම.<br>II. පෞද්ගලික කුලී රථ හා තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබීම (රියදුරු බලපත්‍රය)<br>III. වාහන රියදුරු වශයෙන් වසර 03ක පළපුරුද්ද සහතික මගින් ඉදිරිපත් කළ යුතු ය.<br>IV. අවම උස අඩි 05ක් විය යුතු ය.<br>V. දිවා රාත්‍රී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයේ සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br>VI. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය. |

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|
| 04. යන්ත්‍ර ක්‍රියාකරු ප්‍රාථමික ශ්‍රේණිය | 02 | රු. 12,210-10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 (PL-2(2006A) | I. ජාතික පොදු අධ්‍යන සහතික පත්‍ර (සා.පෙ,) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී කුමන හෝ විෂයයන් 02ක් සමත්වී තිබීම.<br>II. තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් හා මගීන් 32කට වඩා ගෙන යා හැකි බලපත්‍ර ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබාතිබීම (වාහන රියදුරු බලපත්‍රය)<br>III. අවම උස අඩි 05 යි. අඟල් 06ක් විය යුතු ය.<br>IV. බඳවා ගැනීමට යෝජිත තනතුරට අදාල බර යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධව රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීණතාවයක් ලබා තිබීම. (පිළිගත් ආයතනය වශයෙන් රජයේ ආයතනයක්, පළාත් රාජ්‍ය ආයතනයක්, අර්ධ රාජ්‍ය ආයතනයක් පළාත් පාලන ආයතනයක් හෝ රජයේ ලියාපදිංචි පුද්ගලික ආයතනයක් හැඳින්වේ.)<br>V. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතු ය. |
| 05. කාර්යාල සේවක සේවය II පන්තිය (කාර්යාල කාර්ය සහායක) | 01 | රු. 11,730-10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (PL-1(2006A) ආරම්භක පියවර 12 | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී එකවරක දී කවර හෝ විෂයන් 06ක් සමත් වී තිබීම. |
| 06. කාර්යාල සේවක සේවය II පන්තිය (මුරකරු) | 05 | රු. 11,730-10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (PL-1(2006A) ආරම්භක පියවර 12 | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී එකවරක දී කවර හෝ විෂයන් 06ක් සමත් වී තිබීම. |
| 07. කාර්යාල සේවක සේවය III පන්තිය (වැඩ/ක්ෂේත්‍ර කම්කරු) | 02 | රු. 11,730-10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (PL-1(2006A) | අවම සුදුසුකම 8 ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම. |
| 08. කාර්යාල සේවක සේවය III පන්තිය (සෞඛ්‍ය කම්කරු) | 14 | රු. 11,730-10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 (PL-1(2006A) | I. අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

*03. වයස් සීමාව :-*

ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදාල නොවේ.

*03. බඳවා ගැනීමේ ක්‍රමය :-*

(I) සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/95 අනුව සිදුකරනු ලබන විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මත බඳවා ගැනේ.
(II) පෙදරේරු, පැස්සුම්කරු තනතුර සඳහා ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක ලකුණු මත විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනේ.
(III) රියදුරු තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්‍ෂණයේ ලකුණු මත බඳවා ගැනේ.
(IV) යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා වාචික හා ප්‍රායෝගික පරීක්ෂණයක ලකුණු මත විධිමත් සම්මුඛ පරීක්‍ෂණයක් මගින් බඳවා ගැනේ.

*05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(I) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.
(II) වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
(III) තෝරාගනු ලබන්නන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වේ. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලබයි. දැනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර එකක වැඩ බැලීමේ කාලයකට යටත්කර බඳවා ගනු ලැබේ.
(IV) ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභා මුදල් රෙගුලාසිවලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන වෙනත් නියෝගවලට ද, පළාත් පාලන කොමසාරිස් සහ පළාත් පාලන ආයතන ප්‍රධානියාගේ නියෝගවලට ද අනුකූලව සියළුම සේවකයන් බැඳී සිටිය යුතුය.

*06. පොදු සුදුසුකම් :*

(I) ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
(II) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
(III) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වූ වසර 03ක කාලය තුළ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙක් විය යුතුය.

*07. පොදු කොන්දේසි :-*

(I) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම සීතාවකපුර නගර සභාවේ ලේකම් සතුය.

*08. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල සහතික කල පිටපත් ස්වකීය ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුය.*

(I) උප්පැන්න සහතිකය;
(II) ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය ;
(III) මෑතකදී (මාස 6ක් තුළ) ලබාගත් චරිත සහතික 02ක් ;
(IV) පදිංචිය තහවුරු කිරීම පිණිස මෑතකදී (මාස 06 තුළ දී) ප්‍රාදේශීය ලේකම්වරයාගේ අත්සන සහිත ග්‍රාමසේවා සහතිකය ;
(V) වලංගු රියදුරු බලපත්‍රය (රියදුරු තනතුර සඳහා පමණි)
(VI) අධ්‍යාපන සහතික සහ වෘත්තීය සහතික;
(VII) පළපුරුද්ද පිළිබඳ සහතික

එම්. එච්. ටී. ශශිකා දේවප්‍රිය,
ලේකම්,
සීතාවකපුර නගර සභාව,
අවිස්සාවේල්ල.

2013 ජුනි මස 26 වැනි දින,
සීතාවකපුර නගර සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

***සීතාවකපුර නගර සභාව - අවිස්සාවේල්ල***

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ....................................... තනතුර සඳහා බඳවා ගැනීම.*

01. මුලකුරු සමග නම :———————————.
මුලකුරුවලින් හැඳින්වෙන නම් :———————————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———————————.
03. ස්ථිර ලිපිනය :———————————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :———————————.
05. ස්ත්‍රී පුරුෂ භාවය :———————————. විවාහක/අවිවාහක :———————————.
06. උපන්දිනය :———————————.
2013.07.26 දිනට වයස :
අවුරුදු :———————————. මාස :———————————. දින :———————————.
07. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද ? ලියාපදිංචි වීමෙන් ද? :———————————.
08. අධ්‍යාපන සුදුසුකම් (සමත්වූ විභාග පිළිබඳ විස්තර) :———————————.
(I) සමත් වූ වසර/ශ්‍රේණිය:———————————.
(II) අ.පො.ස. (සා.පෙළ) විභාගය:———————————.
විභාග අංකය :———————————.
විභාග වර්ෂය හා මාසය :———————————.

සමත්වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(III) අ.පො.ස. (උ.පෙළ) විභාගය:———————————.
විභාග අංකය :———————————.
විභාග වර්ෂය හා මාසය :———————————.
සමත්වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |

09. වෘත්තීමය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුයි) :———————————.

10. සේවා පළපුරුද්ද :———————————.

11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? :———————————.

12. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවද මම දනිමි.

———————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම්කරු වන ................................ මහතා/මහත්මිය/මෙනවිය, දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................................................ වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

———————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :———————————.
පදවි නාමය :———————————.
දෙපාර්තමේන්තුව/ආයතන:———————————.
(නිල මුද්‍රාව යොදන්න.)
දිනය :———————————.

07-448

# පළාත් පාලන නිවේදන

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව වරිපනම් ප්‍රතිශෝධනය - 2013

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1 හා2) වැනි වගන්තිය යටතේ හා පළාත් පාලන අමාත්‍යවරයාගේ වර්ෂ 2012.06.26 වන දින අංක EPC/ CMS/AD/LA/B/PS/KUCH දරන බල තල වලට අනුව හා 2013.06.25 වන දින පවත්වන ලද කුච්චවේලි ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක 04 යටතේ සභා සම්මත වූ තීරණයට අනුව කුච්චවේලි ප්‍රාදේශීය සභාවේ පාලන බල ප්‍රදේශය අයත් දියුණු ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කොට ඇති සීමාව තුළ පිහිටියා වූ සියලුම නිශ්චල දේපළ සඳහා 2013 වසරේ සිට වරිපනම් බදු ලෙස වාර්ෂික වටිනාකමින් 6%ක් අයකරන අතර කොට්ඨාස අංක 02 පුල්මුඩේ පිහිටා ඇති ලංකා මිනරල් සෑන්ඩ් ලිමිටඩ් සඳහා වරිපනම් බදු 2012 වසර සඳහා අය කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවේ 2013.04.24 වැනි දින අංක TC/301/RA/2012 දරන ලිපිය මගින් හා 2013.05.28 වැනි දින සම අංක දරන ලිපිය මගින් අනුමතිය ලබාදී එය 2012 වසර සඳහා වරිපනම් ප්‍රතිශෝධන තොගයෙන් 6% අයකරන බවත්, 2013 වසර සඳහා ලංකා මිනරල් සෑන්ඩ් ලිමිටඩ් ඇතුලු අනෙකුත් වාණිජ කර්මාන්ත සඳහා වාර්ෂික වටිනාකමින් 10%ක වරිපනම් බදු වශයෙන් අයකරන බවත් මෙයින් සියලු දෙනාටම දැනුම් දෙමි.

අයිනියාපිල්ලෛ මුබාරක්,
සභාපති,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව.

2013 ජූලි මස 03 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය සභාව,
නිලාවෙලි.

07-545

---

## අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

### දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි, අංක 187- අඟුණකොළපැලැස්ස, අංක 188 - ආචාරියගම, අංක 189-යකාගල, අංක 190 - අළුත්වැව යන ග්‍රාම නිලධාරි වසම් දියුණු කළ ප්‍රදේශ වශයෙන් පිළිගත යුතු බවට අඟුණකොළ පැලැස්ස ප්‍රාදේශීය සභාව විසින් 2012.05.29 දින පැවැත්වූ මාසික සභා රැස්වීමේ යෝජනා අංක 8:4 යටතේ යෝජනා සම්මත කිරීමෙන් හා ඒ සඳහා හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ හපපා/ඒ/වරි.ඉ/පොදු 2012.09.03 දිනැති ලිපිය මගින් අනුමැතිය ලැබී ඇති බැවින් ඉහත ග්‍රාම නිලධාරි වසම් දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීම මෙයින් නිවේදනය කරනු ලැබේ.

07-626

---

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථාව

261 වන අධිකාරය වන අංක 1952 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් 2012.10.27 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී පහත උපලේඛනයේ සඳහන් අංක 11.02 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. අයි. අමිලරුවන් කන්දෙආරච්චි,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.

2013 නොවැම්බර් මස 05 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

### උපලේඛනය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සාදනු ලැබ 2011.01.28 දිනැති අංක 1691 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (ආ) වන කොටසේ පළකරන ලද, සබරගමුව පළාත් සභාව විසින් ස්ථිර කරනු ලැබූ බව 2012.03.30 දිනැති අංක 1752 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ පළ කරන ලද්දා වූ සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා වල මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පල කරන ලද දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට, ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ දෙහිඕවිට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

07-420

# විවිධ දැන්වීම්

## බණ්ඩාරවෙල මහ නගර සභාව

### ජල සම්පාදන සම්බන්ධව අතුරු ව්‍යවස්ථා යටතේ වන දැන්වීම

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2වැනි වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1989.01.20 වන දින අංක 541/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) වැනි කොටසේ ප්‍රසිද්ධ කරන ලද්දා වූ සම්මත අතුරු ව්‍යවස්ථා මාලාව බණ්ඩාරවෙල මහා නගර සභාව විසින් ද පිළිගන්නා ලදුව, එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ IX කොටසේ 32 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තු එකී අතුරු ව්‍යවස්ථාවේ II වගන්තිය අනුව පහත උපලේඛනයේ දැක්වෙන පරිදි සංශෝධනය කොට 2013.07.01 දින සිට අය කිරීම සුදුසු බවට මෙම මහ නගර සභාව විසින් සභා සම්මත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ අනුව මේ සම්බන්ධව අංක 1815 දරන 2013.06.14 වන දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ මෙම මහ නගර සභාව විසින් පළකරන ලද ජල සම්පාදනය සම්බන්ධ අතුරු ව්‍යවස්ථා යටතේ දැන්වීම අවලංගු කිරීමට තීරණය කරන ලද බවද මෙයින් දැනුම් දෙමි.

එච්. එම්. ජේ. හේරත්,
නාගරික කොමසාරිස්,
බණ්ඩාරවෙල මහ නගර සභාව.

2013 ජුනි මස 27 වැනි දින,
බණ්ඩාරවෙල මහ නගර සභා කාර්යාලයේදීය.

#### උපලේඛනය

(i) ගෘහස්ථ කාර්යයන් සඳහා මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත ජල ගාස්තු :

| *ඒකක* | *ඒකකයක් සඳහා ගාස්තුව රු. ශ.* |
|---|---|
| 01-05 | 10.00 |
| 06-10 | 15.00 |
| 11-15 | 19.00 |
| 16-20 | 30.00 |
| 21-25 | 45.00 |
| 26-30 | 65.00 |
| 31-40 | 90.00 |
| 41-50 | 105.00 |
| 51 සිට ඉහළට | 125.00 |

ඉහත සඳහන් ගාස්තු වලට අමතරව ස්ථාවර ගාස්තු වශයෙන් රු. 150.00 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(ii) මහ නගර සභා බල ප්‍රදේශයෙන් පිටත පිහිටි ස්ථානවල ගෘහ කාර්යය සඳහා ජල ගාස්තු :

| *ඒකක* | *ඒකකයක් සඳහා ගාස්තුව රු. ශ.* |
|---|---|
| 01-05 | 20.00 |
| 06-10 | 30.00 |
| 11-15 | 40.00 |
| 16-20 | 50.00 |
| 21-25 | 60.00 |
| 26-30 | 70.00 |
| 31-40 | 80.00 |
| 41-50 | 100.00 |
| 51 සිට ඉහළට | 125.00 |

ඉහත සඳහන් ගාස්තු වලට අමතරව ස්ථාවර ගාස්තු වශයෙන් රු. 400.00 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(iii) මහ නගර සභා බල ප්‍රදේශයෙන් පිටත පිහිටි ස්ථාන සඳහා ජල ගාස්තු (ගෘහ සේවාවන්ට අමතරව සෑම ආයතනයක් සඳහා)

| *ඒකක* | *ඒකකයක් සඳහා ගාස්තුව* *රු. ශ.* |
|---|---|
| 01-25 | 75.00 |
| 26-50 | 100.00 |
| 51-75 | 125.00 |
| 76 සිට ඉහළට | 140.00 |

ඉහත සඳහන් ගාස්තුවලට අමතරව ස්ථාවර ගාස්තු වශයෙන් රු. 400.00 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(iv) රජයේ පාසල් සඳහා ජල ගාස්තු :

| *ඒකක* | *ඒකකයක් සඳහා ගාස්තුව* *රු. ශ.* |
|---|---|
| 01-30 | 15.00 |
| 31සිට ඉහළට | 20.00 |

ඉහත සඳහන් ගාස්තුවලට අමතරව ස්ථාවර ගාස්තු වශයෙන් රු. 200.00 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(v) ආගමික ස්ථාන සඳහා ජල ගාස්තු :

| ඒකක | ඒකකයක් සඳහා ගාස්තුව රු. ශ. |
|---|---|
| 01-30 | 1.50 |
| 31 සිට ඉහළට | 2.50 |

ඉහත සඳහන් ගාස්තුවලට අමතරව ස්ථාවර ගාස්තු වශයෙන් රු. 100.00 මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(vi) රජයේ පාසල්වල පවත්වාගෙන යන නේවාසිකාගාර සඳහා ජල ගාස්තු :

| *ඒකක* | *ඒකකයක් සඳහා ගාස්තු* *රු. ශ.* |
|---|---|
| 01-10 | 30.00 |
| 11-20 | 45.00 |
| 21-30 | 50.00 |
| 31-40 | 60.00 |
| 41 සිට ඉහළට | 80.00 |

ඉහත සඳහන් ගාස්තුවලට අමතරව ස්ථාවර ගාස්තු වශයෙන් රු. 400.00 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(vii) ආගමික ස්ථානවලට අයත් ව්‍යාපාරික ස්ථාන සඳහා ජල ගාස්තු :

| *ඒකක* | *ඒකකයක් සඳහා ගාස්තුව* *රු. ශ.* |
|---|---|
| 01-10 | 50.00 |
| 11-20 | 60.00 |
| 21-30 | 70.00 |
| 31-40 | 80.00 |
| 41 සිට ඉහළට | 125.00 |

ඉහත සඳහන් ගාස්තුවලට අමතරව ස්ථාවර ගාස්තු වශයෙන් රු. 200.00 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(viii) මුදල් අය කරන පාසල් සහ මුදල් අය කරන පෙර පාසල් සඳහා ජල ගාස්තු :

| *ඒකක* | *ඒකකයක් සඳහා ගාස්තුව* |
|---|---|
| | *රු. ශ.* |
| 01-10 | 60.00 |
| 11-20 | 70.00 |
| 21-30 | 80.00 |
| 31-40 | 100.00 |
| 41 සිට ඉහළට | 125.00 |

ඉහත සඳහන් ගාස්තුවලට අමතරව ස්ථාවර ගාස්තු වශයෙන් රු. 350.00 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(ix) සාමාන්‍ය හෝටල්, තානායම්, ලැගුම්හල්, වෙළඳ ආයතන, පෞද්ගලික පන්ති පැවැත්වෙන ස්ථාන සහ එවැනි ස්ථාන ඉදිකිරීම සඳහා ජල ගාස්තු :

| *ඒකක* | *ඒකකයක් සඳහා ගාස්තුව* |
|---|---|
| | *රු. ශ.* |
| 01-10 | 60.00 |
| 11-20 | 70.00 |
| 21-30 | 80.00 |
| 31-40 | 100.00 |
| 41 සිට ඉහළට | 125.00 |

ඉහත සඳහන් ගාස්තුවලට අමතරව ස්ථාවර ගාස්තු වශයෙන් රු. 400.00 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(x) රජයේ ආයතන සඳහා ජල ගාස්තු :

| *ඒකක* | *ඒකකයක් සඳහා ගාස්තුව* |
|---|---|
| | *රු. ශ.* |
| 01-10 | 55.00 |
| 11-20 | 56.00 |
| 21-30 | 57.00 |
| 31-40 | 58.00 |
| 41 සිට ඉහළට | 60.00 |

ඉහත සඳහන් ගාස්තුවලට අමතරව ස්ථාවර ගාස්තු වශයෙන් රු. 400.00 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(xi) පෞද්ගලික සංචාරක හෝටල්, රජයේ හෝටල් සහ එවැනි ස්ථාන ඉදි කිරීම් සඳහා ජල ගාස්තු :

| *ඒකක* | *ඒකකයක් සඳහා ගාස්තුව* |
|---|---|
| | *රු. ශ.* |
| 1-25 | 75.00 |
| 26-50 | 100.00 |
| 51-75 | 125.00 |
| 76 සිට ඉහළට | 140.00 |

ඉහත සඳහන් ගාස්තුවලට අමතරව ස්ථාවර ගාස්තු වශයෙන් රු. 1,500.00 ක මුදලක් මාසිකව අය කරනු ලැබේ.

(xii) වෙනත් ගාස්තු හා කොන්දේසි :

| | |
|---|---|
| ලීටර් 3000 ක ජල බවුසරයක් සැපයීම සඳහා | රු. 1,500 0 |
| ලීටර් 5000 ක ජල බවුසරයක් සැපයීම සඳහා | රු. 2,500 0 |

*මහා නගර සභා සීමාවෙන් පිටත ස්ථාන සඳහා බවුසර් මගින් ජලය සැපයීම :*

* මහා නගර සභා බල ප්‍රදේශයෙන් පිටත ආරම්භ වන පළමු කිලෝමීටරය සඳහා ලොරි බවුසරය වෙනුවෙන් රු. 220.00 ක් බැගින් හා අතිරේක සෑම කිලෝමීටරයකටම රු. 120.00 බැගින් වන අතිරේක ගාස්තුවක් අය කරනු ලැබේ.

* ට්‍රැක්ටර් රථයෙන් ජලය ලබා ගන්නේ නම් සෑම කිලෝමීටරයකටම රු. 100.00 ක ගාස්තුවක් අයකරනු ලැබේ.

(xiii) ඉහත සඳහන් සියලු ගාස්තු වලට අමතරව රජය විසින් වරින් වර පනවා අය කරනු ලබන බදු මුදල්ද අය කරනු ලැබේ.
(xiv) ජල මාපකයක් ඉවත් කළ විටක නැවත සවිකරනු ලබන තෙක් එයට ආසන්න පෙර මාස 02 ක දී ලබාගත් මාසික ජල පරිභෝජනයේ සාමාන්‍ය ඒකක ගණන අනුව ගණන් බලා ජල ගාස්තු අය කරනු ලැබේ.
(xv) නව ජල සේවා සම්බන්ධතාවයක් ලබා දීමේදී දරනු ලබන ඇස්තමේන්තුගත පිරිවැය පාරිභෝගිකයා ගෙන් අය කරනු ලැබේ.
(xvi) නව ජල සේවා සම්බන්ධතාවයක් සැපයීම වෙනුවෙන් ඇස්තමේන්තුගත පිරිවැයට අමතරව ආපසු ගෙවනු ලබන රු. 2,000 ක තැන්පත් මුදලක් පාරිභෝගිකයා විසින් සභාවේ තැන්පත් කල යුතුය.
(xvii) මාස 03 කට වඩා පැරණි ජල බිල්පත් ගෙවීමේදී බිල්පතේ සඳහන් ගාස්තුවට අමතරව 10% ක දඩ මුදලක් අය කරනු ලැබේ.
(xviii) විසන්ධි කරනු ලබන සෑම ජල සම්බන්ධතාවයකටම නැවත පිරිද්දුම් ගාස්තු වශයෙන් රු. 1,000 ක ගාස්තු මුදලක් රජයෙන් අනුමත බදුද සමග අය කරනු ලැබේ.

07-623/1

---

## කැකිරාව ප්‍රාදේශීය සභාව

අංක 520/7 සහ 1988 අගෝස්තු 23 වැනි දිනැතිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ II කොටසේ 21 කොටසින් කැකිරාව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2012 වසරේ නොවැම්බර් මස 29 දින පවත්වන ලද ප්‍රාදේශීය සභා මාසික මහ සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රභාත් වීරසේන,
සභාපති,
කැකිරාව ප්‍රාදේශීය සභාව.

*යෝජනාව*

1952 අංක 6 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ II කොටසේ අංක 21 යටතේ අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම තීරයේ ඇති උපලේඛනයට පහත සඳහන් වෙළඳාම් අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් ලෙස ඇතුළත් කිරීමට යෝජනා කරමි.

### උපලේඛනය

*අප්‍රසන්න ව්‍යාපාර :*

1. මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම
2. පෝර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම.
3. සම් පදම් කිරීම
4. සම් විකිණීමට තබා ගැනීම
5. සත්ව පාලනය (මස් කිරි හෝ බිත්තර සඳහා)
6. උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටි තබා ගැනීම
7. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම
8. තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබාගැනීම
9. කරවල, ලුණු මාළු හෝ ජාඩි හොන්ඩර 03ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම
10. මාලු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම
11. පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම
12. දුම්කොල වියළීම
13. සත්ව ආහාර නිපදවීම
14. පුන්නක්කු නිපදවීම
15. සත්ව මාංශ හෝ ලේ පැසවීම
16. සබන් නිශ්පාදනය කිරීම
17. සත්ව ඇටකටු ඇඹිරීම හෝ තබා ගැනීම
18. ට්‍රන්ක් පෙට්ටි සෑදීම
19. අලුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම
20. ලෝහ සුන්බුන් තබාගැනීම
21. ගෘහභාණ්ඩ නිපදවීම
22. වේවැල් භාණ්ඩ නිපදවීම
23. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
24. සිරප් හෝ පළතුරු බීම නිපදවීම
25. රසකැවිලි නිපදවීම
26. පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)
27. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)
28. දත් බුරුසු නිපදවීම
29. රා එකතු කිරීම
30. විනාකිරි නිපදවීම
31. දැව ඉරීම
32. පින්තාරු තීන්ත, වාර්නිෂ් ඩිස්ටෙම්පර් නිපදවීම
33. සෝඩා නිපදවීම
34. කෙඳි සායම් කිරීම
35. සම් භාණ්ඩ නිපදවීම
36. පළතුරු, මාලු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම
37. කෝපි ධාන්‍ය වර්ග පිටි කිරීම
38. බේකින් පවුඩර් නිපදවීම
39. ගෑස් මැන්ටල් නිපදවීම
40. පොට් නිපදවීම
41. කපුරු නිපදවීම
42. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම
43. රෙදි සෝදන නිල් නිපදවීම
44. ලාකඩ නිපදවීම
45. සුවඳ විලවුන් නිපදවීම
46. පාසල් රටහුණු නිපදවීම
47. ටයර් හෝ ටියුබ් නිපදවීම
48. ටයර් නැවත පිරවීම
49. ටයර් ටියුබ් වොල්කනයිස් කිරීම
50. සිමෙන්ති නිපදවීම
51. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම
52. වැලි කඩදාසි නිපදවීම
53. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම
54. ගඩොල් පිළිස්සීම
55. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම
56. අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත ඇසිරීම
57. උළු නිපදවීම
58. පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම
59. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම

*අන්තරාදායක ව්‍යාපාර :*

01. කලුගල් කැනීම හෝ කැඩීම
02. සිසිල්බීම නිෂ්පාදනය
03. අයිස් නිෂ්පාදනය
04. එළවලු තෙල් නිෂ්පාදනය
05. පොල්තෙල් නිෂ්පාදනය
06. ගිණිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
07. මෙතිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය

08. තේ පෙට්ටි නිපදවීම
09. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම
10. පිදුරු තබා ගැනීම
11. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම
12. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම
13. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම
14. හිරිගල් හෝ හුණුගල් කැනීම
15. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම
16. හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම
17. පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීම
18. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම
19. විසිරි පින්තාරු කිරීම
20. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම
21. ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ උපකරණ නිපදවීම)

*අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :*

01. තලාතු මිනිරන් සුද්ද කිරීම
02. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම
03. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම
04. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම
05. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම
06. තෙල් හෝ සත්ව මේද සැපයීම
07. හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම
08. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම
09. මොරතෙල් සකස් කිරීම
10. බෝට්ටු තැනීම
11. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම
12. ලෝහ වර්ග පෑස්සීම
13. මෝටර් වාහන අලුත්වැඩියා කිරීම
14. මෝටර් වාහන සේවා කිරීම
15. යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම
16. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම
17. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
18. මෝටර් වාහන බෝඩි තැනීම
19. කෘමි නාශක, දිලීර නාශක, පැලෑටි නාශක, හෝ පලිබෝධ නාශක නිපදවීම
20. විෂබීජ නාශක නිපදවීම
21. මදුරු දඟර නිපදවීම
22. දැව ආරක්ෂණ නිපදවීම
23. ගල්තාර හෝ බිටුමන්මය ද්‍රව්‍ය නිපදවීම
24. වීදුරු භාණ්ඩ නිපදවීම
25. වීදුරු කැඩපත් නිපදවීම
26. යකඩ තහඩු ගැල්වනයිස් කිරීම
27. පාස්සන ඊයම් නිපදවීම
28. ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම
29. කටුකම්බි නිපදවීම
30. කම්බි ඇණ නිපදවීම
31. කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම
32. බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ කාබන් ටැංකි නිපදවීම
33. ජී. අයි. බාල්දි නිපදවීම
34. වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ නිපදවීම
35. වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ අලුත්වැඩියා කිරීම
36. බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම
37. යන්ත්‍රෝපකරණ නිපදවීම
38. විදුලි භාණ්ඩ නිපදවීම
39. රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම
40. සංචායන බැටරි නිපදවීම
41. ට්‍රැක්ටර් රථ එකලස් කිරීම
42. රේඩියේටර් නිපදවීම
43. ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම
44. වියලි කෝෂ බැටරි නිපදවීම

07-628

---

**බණ්ඩාරවෙල මහ නගර සභාව**

අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් පැවැත්වීමට ස්ථාන ලබාදීම වෙනුවෙන් ගාස්තු පැනවීම

බණ්ඩාරවෙල මහ නගර සභා සීමාව තුළ විවිධ ආයතන විසින් අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් පැවැත්වීමේ දී ඒ සඳහා අවසර ලබාදීම සඳහා පහත උපලේඛනයේ විස්තර වන පරිදි ගාස්තු ප්‍රමාණයන් අයකිරීම සුදුසු බවට බණ්ඩාරවෙල මහ නගර සභාව විසින් තීරණය කරන ලදී.

මෙම උපලේඛනයේ දැක්වෙන ගාස්තු ප්‍රමාණයන් 2013.07.01 දින සිට අයකිරීමට කටයුතු කරනු ලබන බවද මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**උපලේඛනය**

| | *ස්ථානය* | *අදාල කාලය* | *ගාස්තුව* |
|---|---|---|---|
| 01. | බණ්ඩාරවෙල නගර මධ්‍යයේ පිහිටි වෑන් රථ ගාල අසල (සිංහගිරි ආපන ශාලාව අසල) | දින 01ක් සඳහා | 4,000 0 |
| 02. | බණ්ඩාරවෙල ධර්මවිජය මාවත ලොරි රථ ගාල අසල | දින 01ක් සඳහා | 2,000 0 |
| 03. | බණ්ඩාරවෙල නගරයේ වෙනත් ස්ථාන(ජංගම කුඩ ආවරණ භාවිතා කරන වැඩ සටහන් ද ඇතුලුව) | දින 01ක් සඳහා | 1,000 0 |

එච්. එම්. ජේ. හේරත්,
නාගරික කොමසාරිස් (වැ.බ.),
බණ්ඩාරවෙල මහා නගර සභාව.

2013 ජූනි මස 27 වැනි දින,
බණ්ඩාරවෙල,
මහ නගර සභා කාර්යාලයේ දී ය.

07-623/2

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.